DOI: 10.31357/fhssmph.2001.00072

# ආදි බුදු දහමේ සහ කාන්ට්යානු දර්ශනයේ අන්තර්ගත සදාචාර චින්තනය පිළිබඳ විමසුමක්

හෝමාගම ධම්මානන්ද හිමි

2001

# ආදි බුදු දහමේ සහ කාන්ටියානු දර්ශනයේ අන්තර්ගත සදාචාර චින්තනය පිළිබඳ විමසුමක්


හෝමාගම ධම්මානන්ද හිමි
GS/HU/116/96



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බෞද්ධ දර්ශනය
පිළිබඳ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත්
කරනලද නිබන්ධය

## උපදේශකවරුන්ගේ ප්‍රකාශනය

ආදි බුදු දහමේ සහ කාන්ටියානු දර්ශනයේ අන්තර්ගත සදාචාර චින්තනය පිළිබඳ විමසුමක් නැමැති මෙම පර්යේෂණ නිබන්ධය අපගේ උපදෙස් පරිදි මෙම පර්යේෂකයා විසින් සම්පාදනය කරනලද බවත් 31.07.2002. දින මෙම නිබන්ධනය පිළිබඳ පැවති වාචික පරීක්ෂණයේදී පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන ද ඇතුළත් කොට නැවත සකස් කර ඉදිරිපත් කර ඇති බවත් මෙයින් සහතික කරමු.

........................

18 JUN 2001

........................

**Prof. Chandima Wijebandara**
Dean, Faculty of Arts
**Sri Jayawardenepura University**
**Nugegoda - Sri Lanka.**

06 SEP 2002

## පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය. උපදේශකවරුන්ගේ අනුමැතියට යටත්ව මා විසින් ස්වාධීනව සම්පාදනය කරනලද්දක් බවත් 31.07.2002. දින මෙම නිබන්ධනය පිළිබඳ පැවති වාචික පරීක්ෂණයේදී පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන ද ඇතුළත් කොට නැවත සකස් කළ බවත් මෙයින් සහතික කරමි.

........................

බාහිර පරීක්ෂක වරුන්ගේ නිර්දේශ මත සිදුකරන ලද සංශෝධන.

මූලික සංශෝධන:-

පිටු අංක- 2,16,25,31,89,157,173,174,175,176,177,

සුළු සංශෝධන. (මුද්‍රණ දෝෂ):-

පිටු අංක-

**v, vi, vii**

1,2,4,5,6,7,9,11,12,13,14,15,16,20,21,23,24,25,26,28,32,34,35,36,37,38,41,48,49,51,53,54,55,59,61,63,64,67,69,72,81,84,87,88,89,90,91,92,93,94,95,97,99,118,120,124,126,129,131,135,136,138,139,140,141,142,144,145,150,157,166,167,171,180,

## උපදේශකවරුන්ගේ ප්‍රකාශනය

ආදි බුදු දහමේ සහ කාන්ටියානු දර්ශනයේ අන්තර්ගත සදාචාර චින්තනය පිළිබඳ විමසුමක් නැමැති මෙම පර්යේෂණ නිබන්ධය අපගේ උපදෙස් පරිදි මෙම පර්යේෂකයා විසින් සම්පාදනය කරනලද බව මෙයින් සහතික කරමු.

..............................     ..............................

## පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය උපදේශකවරුන්ගේ අනුමැතියට යටත්ව මා විසින් ස්වාධීනව සම්පාදනය කරනලද්දක් බව මෙයින් සහතික කරමි.

..............................

## පිළිගැන්වීම

අපමණ ලෝක ශාසනික සේවාවක්
සිදුකොට අපවත් වී වදාළ
**ලබුගම ශ්‍රී ලඞ්කානන්ද මහානායක**
මාහිමිපාණන් වහන්සේගේ
ශ්‍රී නාමයට
මෙම කෘතිය
උපහාර පූජාවක් වේවා

## උපකාරානුස්මෘතිය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි බෞද්ධ හා පාලි අධ්‍යයනාංශයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන මෙම ශාස්ත්‍රීය නිබන්ධය සාර්ථකව නිමකර ගැනීමේදී අවශ්‍ය උදෙස් ලබාදෙමින්ද ගැටළු තැන් සාකච්ඡා කිරීමෙන්ද දැඩි අවිවේකතාව මධ්‍යයේ වුව තම කාලය වැය කරමින් මා නිරන්තරයෙන් දිරිමත් කළ මාගේ උපදේශකවරුන් වූ මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතා සහ උක්ත අධ්‍යයනාංශයේ වර්තමාන අංශාධිපති ආචාර්ය එච්. එම්. මොරටුවගම මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය මෙහිදී ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි. ඔවුන්ගේ උපදෙස් සහ නිසි මග පෙන්වීම මෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ මූල සාධකය ලෙස මම සලකමි.

මෙම පර්යේෂණ කාර්යයේදී මා මුහුණ දුන් දුෂ්කරතා අපමණය. අවශ්‍ය පොතපත සපයා ගැනීම විශාලම ගැටළුව විය. එහිදී මා විශේෂයෙන් සිහිපත් කළ යුතු යතිවරයාණ කෙනෙකි, බණ්ඩාරගම මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති අධ්‍යාපනපති ගරු කලවානේ ආනන්ද හාමුදුරුවන් වහන්සේ. තවද කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ කථිකාචාර්ය ගරු උඩුහාවර ආනන්ද හිමියන්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය ගරු කඹුරුගොඩ සෝරත හිමියන් විශේෂයෙන් සිහිපත් කරමි.

පොතපත කියවා ලත් දැනුම වඩා සංස්පීතික ලෙස විශ්ලේෂණය කිරීමේදී මා මුහුණදුන් සෑම ගැටළුවක්ම සාකච්ඡා කොට විසඳාදීමට මහාචාර්ය ගුණපාල ධර්මසිරි ශූරීන් ලබාදුන් සහාය ඉතා අගය කොට සලකමි. මාගේ සෑම අධ්‍යයන කාර්යයකදීම සෙවනැල්ල සේ මා පිටුපස සිට මා දිරිමත් කළ අස්මදාචාර්ය පාදෝත්තම ගරු මාවිත්තර වජිරඤාණ මාහිමිපාණන් වහන්සේ සහ ශාස්ත්‍රපති ගරු දොඩමුල්ලේ වඤානන්ද හාමුදුරුවන් වහන්සේ සිහිපත් කරන්නේ ගුරුබැතියෙනි.

මෙහිදී නන් අයුරින් උපකාර කළ මොල්ලිගොඩ ප්‍රවචනෝදය මහ පිරිවෙනෙහි පිරුවන්පති ශාස්ත්‍රපති ගරු කෙම්පිටිකන්දේ දේවානන්ද හිමියන් ඇතුළු ආචාර්ය මණ්ඩලයත්, රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමියන් සහ රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමියන් ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

මා සකස් කළ අත්පිටපත ඉතා පරිස්සමින් කියවා එහි භාෂාමය දුර්වලතා සකසමින්, තම කාලය, ශ්‍රමය සහ ධනය වැය කරමින් මෙය තමන්ගේම කාර්යයක්

ලෙස සලකා පරිගණක ගත කර දුන් අප සොයුරු, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භික්ෂු නේවාසිකාගාරයෙහි උපශාලාධිපති ගරු කහගල සාරානන්ද හිමියන් සිහිපත් කරන්නේ සහෝදරවයෙනි. අවසාන වශයෙන් මාගේ අධ්‍යයන කාර්යයන් සඳහා නන් අයුරින් උපකාර කළ සියලු දෙනාට මාගේ අවංක ආදර ස්තුතිය පිරිනමමි.

## සංකේත නිරූපනය

| | | |
|---|---|---|
| අං. නි. | - | අංගුත්තර නිකාය |
| අං. නි. අ. | - | අංගුත්තර නිකාය අටුවාව |
| ඛු. නි. | - | ඛුද්දක නිකාය |
| නෙ. ප. | - | නෙත්තිප්පකරණය |
| නෙ. අ. | - | නෙත්තිපකරණ අටුවාව |
| දී. නි. | - | දීඝ නිකාය |
| දි. නි, අ. | - | දීඝ නිකාය අටුවාව |
| බු. ජ. ත්‍රි. | - | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා |
| ම. නි. | - | මජ්ඣිම නිකාය |
| ම. නි. අ. | - | මජ්ඣිම නිකාය අටුවාව |
| සං. නි. | - | සංයුත්ත නිකාය |

# පෙරවදන

ආගමික හා දාර්ශනික වශයෙන් විවිධ වූ හා එකිනෙකට විසංවාදී වූ (contradiction) මති මතාන්තරයන්හි ගිලී සිටි භාරතීය ජන සමාජයට මෙන්ම සමස්ත ලෝකයාට ද නව දහමක් (doctrine) දේශනා කළ බුදු රජාණන් වහන්සේ, එමගින් එතෙක් පැවති ලෝක දෘෂ්ටිය (world vision) නිශේධනය කළා පමණක් නොව මෙම ක්ෂේත්‍රයන්හි නව පෙරළියක් ඇති කිරීමටද සමත් වූහ. එම දහමෙහි කේන්ද්‍රීය ඉගැන්වීම වූයේ පියවි ඉන්ද්‍රිය ධර්මය මගින් ගෝචර ග්‍රහනය කරන්නේ, ලෝක යථාර්ථය හෙවත් ප්‍රකෘතිය (reality of the world) නොවන බවයි. ප්‍රකෘතිය අපි නොදනිමු, නොදකිමු. මේ නොදැනීම හෙවත් අනවබෝධය නිසා අපි සංසාරික වශයෙන් නිරන්තර (නොනිමි) ගමනක යෙදී සිටිමු. විකෘතිය (unreal) ප්‍රකෘතිය (real) සේ දකිනාතාක් එයින් ගැලවීමක්, මිදීමක් හෝ නිදහස්වීමක් සිදු නොවේ. මෙය දකින්නේ හෝ අවබෝධ කර ගන්නේ කෙසේද? ඒ සඳහා වූ මගක් තිබේද? එසේ ඇත්නම් එහි ස්වභාවය (nature) කෙබඳුද? ආදි බුදු දහම (early Buddhism) උත්සාහ දරන්නේ මෙය පැහැදීමටය. මේ සඳහා පිළිතුරු සැපයීමටය.

බුදු දහමේ මෙම කේන්ද්‍රීය ඉගැන්වීම වටා බැඳී ඇත්තේ සදාචාර දර්ශනය යි. එහි සංස්ථිතික ස්වරූපය විධිමත් විමර්ශනයකට හෙවත් විශ්ලේෂණයකට බඳුන් කිරීමට මෙහිදී මම උත්සාහ ගනිමි. බුදු දහම තුළ උගන්වන සදාචාර සංකල්ප (moral concepts) හා බෙහෙවින් සමානත්වයක් ප්‍රකට කරන, බටහිර ලෝකයේ බිහිවූ කිසියම් සදාචාර දාර්ශනික පද්ධතියක් වේ නම් ඒ අන් කිසිවක් නොව නූතන බටහිර දර්ශනයේ (modern western philosophy) අග්‍ර ඵලය ලෙස සලකනු ලබන ඉමැනුවෙල් කාන්ට් (Immanuel kant) ගේ දර්ශනය බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත. මේ සඳහා වූ හේතු සාධක අපි සාකච්ඡා කරන්නෙමු.

පෙරදිග අග්‍රගන්‍ය දාර්ශනික සම්ප්‍රදාය (philosophical tradition) ගත් මග සනිටුහන් කරමින් අපරදිග ලෝකයේ නූතන දර්ශනය විප්ලවීය ලෙස නව මාවතකට යොමු කිරීමට යුග ප්‍රවර්තකයකු ලෙස ක්‍රියා කළ කෙනෙකි, මහාචාර්ය ඉමැනුවෙල් කාන්ට් (ක්‍රි.ව. 1724-1804). දර්ශන ශාස්ත්‍රය සම්බන්ධයෙන් ඔහු කළ මෙහෙවර භෞතික විද්‍යා ක්ෂේත්‍රය තුළ නිකලස් කොපර්නිකස් (ක්‍රි.ව. 1473 - 1543) නම් විද්‍යාඥයා කළ විප්ලවයට සමාන

බව ඉමැනුවෙල් කාන්ට් ම ප්‍රකාශ කරයි. එය එසේ වූවක් බව පසුකාලීන දාර්ශනිකයන් හා චින්තකයන් විසින්ද පිළිගෙන ඇත.

වසර දහස් ගණනක් තිස්සේ අප ජීවත්වන විශ්වය සම්බන්ධයෙන් ස්ථාපිතව පැවති සංකල්පය වූයේ සූර්යයා ඇතුළු ග්‍රහවස්තූන් පෘථිවිය කේන්ද්‍රකොට ගෙන එය වටා භ්‍රමනය වන බවයි. (මෙය ටොලමිගේ පෘථිවි කේන්ද්‍රවාදයයි.) එහෙත් මෙම ආචීර්ණ කල්පිත මතය බැහැර කොට නවතම මතයක් විශ්වය සම්බන්ධයෙන් ආදේශ කළ නිකලස් කොපර්නිකස් කියා සිටියේ පෘථිවිය නොව සූර්යයා කේන්ද්‍රකොට ගෙන ග්‍රහ මණ්ඩලය (ආකාශ වස්තූන්) පවත්නා බවයි. හෙවත් ගමන් ගන්නා බවයි. මෙම නව මතය සූර්ය කේන්ද්‍රවාදයයි. භෞතික විද්‍යාව හා එම ක්ෂේත්‍රය තුළ අද (වර්තමානයේ) ලෝකය පිළිබඳව කෙරෙන සියළුම නිරීක්ෂණ (observations), පරීක්ෂණ (experiments) සහ සම්පරීක්ෂණ යනාදිය මගින් එළඹෙන නිගමන මෙන්ම එම ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා ආධාර වූයේද උක්ත පදනම් වාදයයි. එම නිසා භෞතික විද්‍යා ක්ෂේත්‍රය තුළ ටොලමිගේ පෘථිවි කේන්ද්‍රවාදය මත ප්‍රතිෂ්ඨාපිතව පැවති දැනුම් පද්ධතිය ප්‍රතික්ෂේප වී කොපර්නිකස් ගේ සූර්ය කේන්ද්‍රවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීම "විප්ලවයක්, මත පෙරළියක්" ලෙස සටහන් වේ. ඉමැනුවෙල් කාන්ට් විසින්ද දර්ශන ක්ෂේත්‍රය තුළ සිදුකළ චින්තන විප්ලවය මෙබඳුම වූවකි.

යුග ප්‍රවර්තක කාන්ටියානු මතය, හෙවත් විප්ලවය කුමක්ද? නූතන බටහිර දර්ශනයේ අවසානය තෙක්ම පිළිගෙන පැවති, මිනිස් ඥානය (knowledge) ගොඩනැගෙන ආකාරය පිළිබඳ සංකල්පය වූයේ එක්කෝ බුද්ධිය, නැත්නම් අනුභූතිය ප්‍රධාන වන බවයි. මින් එකක් බුද්ධි වාදය (Rationalism) යි. අනෙක අනුභූති වාදය (Empiricism) යි. එනම් ලෝකය පිළිබඳව මිනිස් මනස තුළ දැනුම ගොඩ නැගෙන්නේ බාහිර විෂය ගෝචර වස්තූන්ට අනුරූපව අපගේ මනස වෙනස් වීමෙන් බවයි. අප එම වස්තූන් ග්‍රහනය කරන්නේ ඒවා පවතින ආකාරයෙන්මය. ඉමැනුවෙල් කාන්ට් මෙම මත ප්‍රතික්ෂේප කරයි. ප්‍රාග් ආනුභූතිකවම (before the experience) අප තුළ කාලය සහ අවකාශය (time and space) යන සංවේද්‍යතා පසුබිම සහ අවබෝධතා පදාර්ථ මගින් සකස් කෙරෙන බාහිර ලෝකය පිළිබඳ දැනුමකි, අපට ඇත්තේ. එනම් මනස බාහිර ලෝකයේ පවත්නා වස්තූන්ට අනුකූලව සකස්වීම නොව බාහිර විෂය ගෝචර වස්තුව මනසට අවශ්‍යවන ආකාරයට සකස්වී හැඩ ගැසී ගොඩ නැගේ. මේ නිසාම අප විෂය වස්තූන් දකින්නේ ඒවා පවතින අයුරින් නොව

හුදෙක් අප පවතින ආකාරයෙනි. (we see things not as they are, but as we are.)

මේ අනුව බාහිර ලෝකයේ යථාර්ථය (reality of the world) කුමක්දැයි අපට නිශ්චය කළ නොහැකිය. අපගේ දෘෂ්ටිය විකෘතියකි. ප්‍රකෘතිය කුමක්දැයි අපි නොදනිමු. එහෙත් ප්‍රකෘතියක් තිබිය යුතුය. එය වටහා ගැනීම පරමාර්ථ නිශ්ඨාවක් (ultimate goal) කරා ගමන් කිරීමක් විය හැකිය. එසේම එය විමුක්තිය වැනි ස්වභාවයක් විය හැකිය. සෑම පුද්ගලයකුගේම අපේක්ෂාව එවැනි තත්ත්වයක් කරා ලඟාවීමය. විටෙක කාන්ට්ගේ ජීවන රටාව ගැන පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ ඔහු මෙවැනි උත්තරීතර (transcendental) අවබෝධයකින් පසු වූ අයෙකි යන්නයි. එහෙත් එවැන්නක් සනාථ කිරීම සඳහා ස්ථිරසාර සාක්ෂියක් ඉදිරිපත් කිරීම අපහසුය. බෙහෙවින් සදාචාරය ගරුකොට සලකා ඔහු ක්‍රියාකොට තිබීම හා එයට මහත් උසස් තැනක් ලබාදී තිබීම බෙහෙවින් අගය කළ යුතු කරුණකි. මෙයට හේතුව බෙහෙවින් බටහිර ලෝකය තුළ මෙවැනි ස්වභාවයක් විද්‍යමාන වීමට ඇති ඉඩ කඩ හිඟ බැවිනි.

මෙසේ බුද්ධිවාදී සහ අනුභූතිවාදී සංකල්පයන්ගේ සංකලනයක් ලෙස ඉදිරිපත් කෙරී ඇති කාන්ටියානු දර්ශනය ඥාන විභාගය (epistemology or theory of knowledge) ලෝක විභාගය (cosmology) හා ආචාර ධර්මය (ethics) යන දර්ශන විෂයට අයත් ප්‍රධාන අංශයන් සමග තුලනය කිරීමේදී පෙරදිග ප්‍රකට වෙනත් කිසිදු දහමකට හෝ දර්ශනයකට වඩා සමීපවත්වයක් දක්වන්නේ, ආදි බුදු දහම සමගය. සූත්‍ර පිටකයට අයත් මජ්ඣිම නිකායාගත මධුපිණ්ඩික වැනි සූත්‍රයක් නිදසුන් ලෙස දක්වතොත් කාන්ටියානු ඥාන විභාගය බෙහෙවින් ඒ හා සමානත්වයක් ප්‍රකට කරයි. ලෝක විභාගය පිළිබඳ යථාර්ථයද එසේමය. ඉමැනුවෙල් කාන්ට් යථාර්ථ වූ ලෝක විෂය අපට ගෝචර ග්‍රහනය නොවන බව ඉදිරිපත් කරන අතර ආදි බුදු දහම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ සිද්ධාන්තය විවරණය මගින් ක්ෂණභංගුර බව හා බාහිර ලෝකයේ ප්‍රකෘති ස්වභාවය පෙන්වා දෙයි. ලෝකය හා පුද්ගලයා පිළිබඳව ප්‍රඥාලෝකය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සදාචාරයේ පාරප්‍රාප්තියට යායුතු බව බුදු දහම අවධාරණය කරන අතර ඉමැනුවෙල් කාන්ට්ද තම සදාචාර සංකල්ප විශ්ලේෂණය එවැනිම අගයකින් ඉදිරිපත් කර තිබේ. මෙම අධ්‍යයනයෙහි මුඛ්‍ය අරමුණ වන්නේත් අන් සියලුම අංශයන් ද්විතීයික කොට බෞද්ධ සහ කාන්ටියානු සාදාචාර සංකල්ප විශේෂ කොට තුලනය කිරීමය.

ආදි බුදු දහමේ සහ කාන්ටියානු දර්ශනයේ ඓතිහාසික සහ දාර්ශනික පසුබිම කුමක්ද යන බව පළමු පරිච්ඡේදය තුළදී සාකච්ඡා කෙරේ. බුදු දහම විකසිත වූ අවධිය වනවිට භාරතීය සමාජය තුළ පැවති ආගමික සහ දාර්ශනික පසුබිමත් ඉන් පෙර වූ තත්ත්වයනුත් සංක්ෂිප්ත වශයෙන් සාකච්ඡා කෙරේ. බුදු දහමේ විශේෂතාව හඳුනාගත හැක්කේ එහි ඓතිහාසික පසුබිම විශ්ලේෂණය කිරීම මගිනි. එසේම බටහිර දර්ශනය ඔස්සේ ගොඩනැගුණු කාන්ටියානු චින්තාවේ පසුබිම ද මෙම පරිච්ඡේදයේ අන්තර්ගත කොට ඇත. කාන්ටියානු දර්ශනයේ ඓතිහාසික පසුබිම ගැන සටහන් කිරීමේදී බටහිර ලෝකයේ බිහි වූ දාර්ශනික පද්ධතීන් පිළිබඳව දීර්ඝ විවරණයක් සිදු නොකරන ලද්දේ එම දාර්ශනික පද්ධති අතර ඍජු වූ සම්බන්ධතාවක් නොමැති බැවිනි. එබැවින් ඉතා සංක්ෂිප්ත ලෙස බටහිර දර්ශනය විවරණය කරමින් ඒවා කාන්ට්ගේ දර්ශනය සඳහා පසුබිම් වූ ආකාරය පෙන්වා දේ. බුදු දහමේ මෙන්ම කාන්ටියානු දර්ශනයේ දාර්ශනික සංකල්ප තරමක් පුළුල් ලෙස ඉදිරිපත් කෙරේ.

මෙම පර්යේෂණය මුළුමනින්ම සදාචාර විෂය මත පදනම් වූවක් බැවින් දෙවන පරිච්ඡේදය ඒ සඳහා වෙන්වී ඇත. එහිදී සදාචාර විෂයේ ස්වරූපය. එහි සීමාවන් සහ විවිධ වූ සදාචාර පද්ධති එකිනෙක විවරණය වී ඇත. විශේෂයෙන් බටහිර ලෝකයේ සමකාලීන අවදිය නියෝජනය කරන සදාචාර දාර්ශනිකයන්ගේ සංකල්ප විශ්ලේෂණය මේ සඳහා පදනම් වී ඇත.

අපගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ ආදි බෞද්ධ සහ කාන්ටියානු සදාචාර සංකල්ප තුලනය කිරීමය. තෙවන පරිච්ඡේදය වෙන් වූයේ මේ සඳහාය. එහිදී මෙම පද්ධති දෙකෙහි සමතා මෙන්ම විසමතාද හුවා දැක්වීමට මහන්සි ගන්නා ලදී.

සදාචාර විෂය සම්බන්ධයෙන් කෙරෙන අධ්‍යයනයකදී විශේෂ අවධානයක් යොමු කෙරෙන අංශයකි, සදාචාර විෂය හා බැඳී පවතින ගැටළු සාකච්ඡා කිරීම. "සදාචාරය පිළිබඳ ප්‍රායෝගික ගැටළු" යන හිසින් සිව්වන පරිච්ඡේදයේදී මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. අවසාන වශයෙන් මෙම කරුණු අධ්‍යයනය මගින් අපට එළඹිය හැකි නිගමනය ඉදිරිපත් කරමින් පස්වන පරිච්ඡේදයේ සමාලෝචනයක යෙදී ඇත. මෙම පර්යේෂණයේ" විශේෂයෙන් අදාල දාර්ශනික පද්ධති දෙකෙහි මූල ග්‍රන්ථම පරිශීලනයට උත්සාහ ගන්නා ලද අතර අතිරේක වශයෙන් මේ සම්බන්ධයෙන් ලියවී ඇති පර්යේෂණ කෘතිය පරිශීලනය කෙරිණි.

..............................

# පටුන


පිළිගැන්වීම

උපකාරානුස්මෘති I - II

සංකේත නිරූපනය III

පෙරවදන IV - VII

පටුන VII - X

පළමු පරිච්ඡේදය:

ආදි බුදු දහමෙහි සහ කාන්ටියානු දර්ශනයෙහි ඓතිහාසික සහ දාර්ශනික සන්දර්භය. 01-56

1.1 ආදි බුදු දහමෙහි ඓතිහාසික සන්දර්භය. 01-17

1.2. ආදි බුදු දහමෙහි දාර්ශනික පදනම 17-31

1.3. කාන්ටියානු දර්ශනයෙහි ඓතිහාසික පසුබිම. 31-43

1.4. කාන්ටියානු චින්තනයේ දාර්ශනික පදනම. 43-50

දෙවැනි පරිච්ඡේදය:

සදාචාරයට දාර්ශනික ප්‍රවේශය. 57-94

2.1. ආචාර ධර්ම හෙවත් සදාචාරය යනු කුමක්ද? 57-59

2.2. ආචාර ධර්ම විෂයයේ ස්වරූපය සහ අර්ථකථන 59-62

2.3. සදාචාරාත්මක චර්යා වෙනත් ක්‍රියාවන්ගෙන් විශේෂකොට හඳුනා ගැනීම. 62-65

2.4. සදාචාරාත්මක මානව වයසීා විශේෂකොට හඳුනා ගැනීම. 65-67

2.5. ආගමික සහ සමාජ සදාචාරය අතර පවත්නා විශේෂතාවන් 67-69

2.6. ආචාර ධර්ම වාදියාගේ සහ සදාචාර දාර්ශනිකයාගේ සුවිශේෂ කායසීා භාරය. 69-71

2.7. ප්‍රාමාණික හා අධි ආචාර ධර්ම පිළිබඳ විශ්ලේෂණය 71.

2.8. සාධ්‍යතාවාදී මූලධර්මය 71-76

2.9. ආත්මාර්ථවාදී සුඛපරමවාදය. 76-78

2.10. පරාර්ථ සුඛසාධන වාදය 78

2.11. යුක්ත්‍යාත්මවාදී ප්‍රාමාණික මූල ධර්මය 78-81

2.12. අධි ආචාරාත්මක මූලධර්ම 81-85

2.13. ඒ.ජේ. එයර්ගේ විශ්ලේෂණය. 85-87

2.14. ජී.ඊ. මුවර්ගේ විශ්ලේෂණය 87-88

2.15. ආර්.එම්. හෙයාර්ගේ විශ්ලේෂණය 88-90

තෙවැනි පරිච්ඡේදය:

බෞද්ධ සහ කාන්ටියානු සදාචාර සංකල්ප තුලනය කිරීම. 95-145

3.1. බෞද්ධ සදාචාර සංකල්ප විග්‍රහය. 95-118

3.2. කාන්ටියානු සදාචාර සංකල්ප විග්‍රහය 118-133